# 12 අපේ ගංගා හා දිය ඇලි

අපේ ශ්‍රී ලංකාව ලෝකෙ තියන ලස්සන රටක්. හුඟාක් ලස්සන තැන් එහි තියෙනවා. ඉතා ඈත අතීතේ ඉඳලා අපට ඉතා වටිනා දයාද හා උරුමයන් අයිති වෙලා තියෙනවා. ලංකාවේ තියන ගංගා හා දිය ඇලිත් ඒ දයාද අතර තිබෙන ඒවා තමයි. මේ ගංගා හා දිය ඇලි නිසා ලංකාව ලස්සන දිවයිනක් වෙලා තියෙනවා.



"මහවැලි" ගඟ තමයි ලංකාවේ තියෙන දිග ම ගඟ. ඒ ගඟ කිලෝමීටර් තුන්සිය තිස්පහක් විතර දිගයි. කැලණි ගඟ, වලවේ ගඟ, කළු ගඟ, ගිං ගඟ අපේ රටේ තවත් ප්‍රධාන ගංගා කිහිපයක්. ඒ හින්දා තමයි අපේ රට සරු සාර වෙලා තියෙන්නෙ. මේ ගංගා ගැන කවිත් ලියලා තියෙනවා.

මහවැලි කැලණි වලවේ කළු යන ගංගා
සමනල කන්ද මුදුනේ සිට පැන නැංගා
බැවුම් තැනිතලා හෙල් අතරින් රිංගා
මේවා ගලයි මිණි කැට දිය යට හංගා



මේ ගංගා අපේ රටේ කඳුකරය හරහා ගලාගෙන එනකොට දිය ඇලි ඇති වෙනවා. කඳුරට හුඟක් ලස්සන වෙලා තියෙන්නෙ මේ දියඇලි නිසා තමයි. මීටර් දෙසිය හතළිහක් විතර උස බමර කන්ද ඇල්ල තමයි ලංකාවේ උස ම දිය ඇල්ල. ලස්සන දිය ඇල්ල හැටියට බොහෝ අය සලකන්නේ දුන්හිඳ ඇල්ල. ඒ ඇල්ලෙ උස නම් මීටර් පනස් අටක් විතර ඇති. දියලුම හා ලක්ෂපාන තවත් දියඇලි දෙකක් මේ ගංගා, දිය ඇලි අපට බලන්න පුළුවන් වෙන්නේ පරිසරය රැකගත්තොත් තමයි.

## ක්‍රියාකාරකම : 1

i. මෙම පාඩම නිශ්ශබ්ද ව කියවන්න.
ii. මෙම පාඩම තනි තනි ව හඬ නගා කියවන්න.
iii. පාඩමේ ඇති කවිය ගායනා කරන්න.

## ක්‍රියාකාරකම් : 2

අපේ රටේ ගංගා වලට සම්බන්ධ දිය ඇලි කිහිපයක් පහත දැක්වේ. ඒවා ශබ්ද නගා කියවන්න.

| ගංගා | දියඇලි |
|---|---|
| නිල්වලා ගඟ | රත්න ඇල්ල |
| මහවැලි ගඟ | දියලුම ඇල්ල |
| මී ඔය | බේකර්ස් ඇල්ල |
| කැලණි ගඟ | බෝපත් ඇල්ල |
| වලවේ ගඟ | ගැරඬි ඇල්ල |
| ගිං ගඟ | කිරිඳි ඇල්ල |
| මහ ඔය | දූවිලි ඇල්ල |
| මාදුරු ඔය | ඩෙවෝන් ඇල්ල |

## ක්‍රියාකාරකම : 3

පහත සඳහන් ගීතය ගායනා කරන්න.

කළු කැලණි නදී ගලා යාවී
මනහර ය සිරි ය ලංකාවේ ලංකාවේ, ලංකාවේ.
සමනල කිරිගල් පිදුරුතලාගල - ආදාගල කඳු පේළි
හග්ගල පේරාදෙණියේ මල්වතු - දුන්හිඳ ඇල්ලේ සෝබා
සීගිරි සිතුවම් දඹුලු පොළොන්නරු - ගල් කැටයම් පෙළ සැදී
අවුකන පිළිමේ දෙන බුදු මහිමේ - ඉසුරුමුණිය මනහාරී
සොරබොර වැව හා මහියංගණය ද - බින්තැන්නට එක් වූයේ
කතරගමේ කිරිවෙහෙර තිබෙන්නේ - නාගදීප ඇත උතුරේ

ගීතයේ ඇති අපේ රටේ වැදගත්කමකින් යුත් ස්ථාන, ගංගා, කඳු, මල්වතු, ආගමික ස්ථාන, ඉතිහාසය හා සම්බන්ධ තැන් වෙන් වෙන් ව ලියන්න.

## ක්‍රියාකාරකම : 4

පුවත්පත්, පෙළපොත්, විවිධ සඟරා සහ බාහිර පොතපත කියවා ඉහත ක්‍රියාකාරකම් 3 හි සඳහන් ස්ථාන පිළිබඳ ව ලියැවී ඇති තොරතුරු එක් රැස් කරන්න.